ඔබ පවසන, ඔබ ඇරයුම් කරන දෑ චමත්කාරය. අපි සිදු කළ දෑ සඳහා ප්රතිකර්මය කුමක් දැයි ඔබ අපට දන්වා සිටින්නෙහි නම් මැනව

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: දේවත්වය ආදේශ කරන ජනයා අතරින් පිරිසක් මිනිස් ඝාතන බොහෝ සේ සිදු කරමින් දුරාචාරයේ බොහෝ සේ නිරත වෙමින් සිටියෝය. එබැවින් ඔවුහු මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ: "ඔබ පවසන, ඔබ ඇරයුම් කරන දෑ චමත්කාරය. අපි සිදු කළ දෑ සඳහා ප්රතිකර්මය කුමක් දැයි ඔබ අපට දන්වා සිටින්නෙහි නම් මැනව" යැයි විමසා සිටියෝය. එවිට මෙම පාඨය පහළ විය. "තවද ඔවුහු වනාහි අල්ලාහ් සමග තවත් දෙවියකුට අයද නොසිටිති. තවද අල්ලාහ් තහනම් කළ ආත්මය නියමයකින් තොර ව මිස ඔවුහු ඝාතනය නොකරති.
තවද කාම අපචාරයේ නිරත නොවෙති..." (අල්-ෆුර්කාන්: 68), "අහෝ තමන් විසින් තමන්ව නසා
ගත් මාගේ ගැත්තනි! අල්ලාහ්ගේ කරුණාව ගැන නුඹලා අපේක්ෂා රහිත නොවනු..." (අස්-
සුමර්: 53)
[صحيح] [متفق عليه]

දේවත්වය ආදේශ කරන්නන් අතරින් පිරිසක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණියේය. ඔවුන් අධික ලෙස මිනිස් ඝාතන, දුරාචාරය සිදු කළ පිරිසකි. ඔවුහු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් හට: සැබැවින්ම තමන් ට ඇරයුම් කරන ඉස්ලාමය හා ඉගැන්වීම ඉතා ලස්සන කරුණක් වන නමුත් අපගේ තත්ත්වය කුමක් ද? දේව ආදේශයේ හා මහා පාපයන්හි අප වැටී තිබීමේ තත්ත්වය කුමක් ද? ඒ සඳහා ප්රතිකර්ම තිබේ ද? යැයි විමසා සිටියහ. එවිට අල් කුර්ආන් පාඨ දෙකක් පහළ විය. ඒ අනුව පාපකම් අධික වුව ද බරපතල වුව ද මිනිසා කරන තව්බා නොහොත් පශ්චාත්තාප වීම අල්ලාහ් පිළිගන්නේය. එසේ නොවී ඔවුන්ගේ දේව ප්රතික්ෂේපයේ හා අපරාධවල දිගටම නිරතවී සිටියේ නම් ඔවුන් මෙම දහමට පිවිසෙන්නේ නැත.

http://sunnah.global/hadeeth/si/show/65071